# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 35 දරන ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2006** ඔක්තෝබර් මස **26** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 ඔක්තෝබර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 10.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 ඔක්තෝබර් මස 26 වන දින]

එල්. ඩී.— ඕ. 43/2004.

**1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තියේ" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ඇතුළත් කරනු ලැබේ :— 1968 අංක 15 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

> "අමාත්‍යවරයාගේ නියෝගයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ප්‍රදේශ ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සංස්ථාවක් පිහිටුවීම පිණිස ද ; එම සංස්ථාව විසින් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉදිකිරීමේ කාර්යයන් සහ උපදේශක පැවරුම් භාරගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එහි 2අ සහ 2ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ සහ 2ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ඉඩම් ප්‍රදේශයක් පිරවීමට හෝ සංවර්ධනය කිරීමට එරෙහිව තහනම් පැනවීම.

2අ. (1) සංස්ථාවේ ලිඛිත අනුමතය නොමැතිව, කිසිම තැනැත්තකු විසින්, 2 වන වගන්තිය යටතේ ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත යම් ඉඩම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි යම් ඉඩම් ප්‍රමාණයක් කවර හෝ ආකාරයකින් පිරවීම හෝ සංවර්ධනය කිරීම නොකරනු ලැබිය යුතු ය.

(2) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත යම් ප්‍රදේශයක් ඇතුළත වූ යම් ඉඩම් ප්‍රමාණයක් පිරවීම සහ සංවර්ධනය කිරීම සඳහා අනුමතය ඉල්ලා සිටිනු ලබන කවර හෝ තැනැත්තකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත, අවශ්‍ය යයි සංස්ථාව සලකන යම් නියම හා කොන්දේසි මත එසේ කිරීමට සංස්ථාව විසින් අනුමතය දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකරන්නා වූ හෝ (2) වන උපවගන්තිය යටතේ අනුමතයක් දෙන ලද්දේ යම් නියම සහ කොන්දේසි මත ද, එම නියම සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ හෝ සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන බවට සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා වෙත දන්වනු ලබන අවස්ථාවක, නීති විරෝධී ක්‍රියාකාරකම් කරගෙන යාමෙන් ඒ තැනැත්තා වළක්වාලීම සඳහා සියලු නිසි පියවර ඔහු විසින් ගත යුතු අතර, නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යනු ලබන්නේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා තිබෙන්නේ කවර පොලිස් ස්ථානයක බල ප්‍රදේශයක් තුළ ද ඒ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාගේ සහාය අවශ්‍ය අවස්ථාවන්හි දී සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ලබාගත හැකි ය. (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යාමෙන් ඒ තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් හෝ සේවකයන් හෝ වළක්වාලීම සඳහා අවශ්‍ය සියලු සහාය ප්‍රධාන විධායක නිලධරයාට හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ ලබාදීම ඒ පොලිස් නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් නීති විරෝධී ක්‍රියාකාරකමක් කරගෙන යාමෙන් යම් තැනැත්තකු වළක්වාලීමට (4) වන උපවගන්තිය යටතේ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු හෝ අපොහොසත් වන අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කිරීමෙන් ඔහු හෝ ඔහුගේ අනුයෝජිතයන් හෝ සේවකයන් හෝ වළක්වාලන ආඥාවක් සහ අවශ්‍ය අවස්ථාවක ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ගොඩනගන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳහෙළීමේ බලය හෝ ඒ ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් තමාගේ භාරයට ගැනීමේ බලය හෝ තමාට ලබාදෙන ආඥාවක් නිකුත් කිරීම සඳහා, ඒ ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පරීක්ෂණය නිම කරනු ලැබූ පසු, යම් ඉඩම් ප්‍රමාණයක් පිරවීමේ හෝ සංවර්ධනය කිරීමේ නීත්‍යානුකූල බලය හේතු දක්වන තැනැත්තාට ඇතැයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවුවහොත් —

(අ) මේ වගන්තිය කඩ කෙරෙන යම් ක්‍රියාවක් කිරීමෙන්, ඒ තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයන් හා සේවකයන් වළක්වාලන ආඥාවක් ; සහ

(ආ) අවශ්‍ය වන්නේ නම්, යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ බලය දෙන ආඥාවක් ද මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

(7) (2) වන උපවගන්තිය යටතේ අනුමතය දෙන ලද්දේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා හට අනුමතය දෙනු ලැබුවේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක ඒ නියම සහ කොන්දේසිවලට

අනුකූලව කටයුතු කරන ලෙස ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් එසේ පැහැර හරිනු ලැබුවහොත් එකී ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් හෝ පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව තුළ ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කර —

(අ) පැනවූ නියම සහ කොන්දේසි කඩකරමින් ක්‍රියා කිරීමෙන් ඒ තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන් වළක්වන ; සහ

(ආ) පැන වූ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරගෙන යාමට හෝ කටයුතු කරගෙන යාමට සැලැස්වීමට සහ ඒ කටයුතුවල වියදම ඒ තැනැත්තාගෙන් අයකර ගැනීමට සංස්ථාවට හැකිකරවන,

ආඥාවක් ලබාගත යුතු ය.

(8) පිළිවෙලින් (5) වන උපවගන්තිය සහ (7) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් මේ පනතේ 20 අ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

යම් ප්‍රදේශයක් පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

2ආ. (1) 2 වන වගන්තිය යටතේ ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශයක් නොවන යම් ඉඩම් ප්‍රදේශයක් පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ප්‍රදේශයක් වශයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අතර, එවැනි යම් ඉඩම් ප්‍රදේශයක් පිරවීමේ දී හෝ සංවර්ධනය කිරීමේ දී අනුගමනය කළ යුතු අවශ්‍යතා ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) යම් ප්‍රදේශයක් පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක ඒ ප්‍රදේශයේ මායිම් සහ ඉම් සලකුණු දක්වමින් ඒ ප්‍රදේශය වෙන් කර දක්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීම, ඒ උපවගන්තිය යටතේ ප්‍රකාශිත යම් ප්‍රදේශයක් පිරවීමේ හෝ සංවර්ධනය කිරීමේ කටයුත්තක් කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු අතර, එය කඩ කරමින් ක්‍රියා කරන ඕනෑම තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ගොඩනැගිලි ඉදිකිරීමේ හෝ අනුබෙදීම් කාර්යය සඳහා අනුමතය ලබාගැනීමට අවශ්‍ය ඒ නියමය මගින් ප්‍රකාශිත ප්‍රදේශය ඇතුළත ඇති පළාත් පාලන ආයතන හෝ වෙනත් යම් ආයතන විසින්, ඒ අනුමතය දීමේ දී ඒ නියමයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන ලද බව සහතික වශයෙන් දැන සිටිය යුතු අතර, ඒ අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොමැති අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ආයතන සෑහීමකට පත්වන පරිදි ඒ අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරනු ලබන තෙක් අවස්ථාවෝචිත පරිදි, ඒ ගොඩනැගිලි ඉදිකිරීමට හෝ අනුබෙදීමට අනුමතය දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය ඒ ආයතනවලට තිබිය යුතු ය.

(5) යම් තැනැත්තකු (3) වන උපවගන්තිය කඩ කරමින් ක්‍රියා කරන බව සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා වෙත දන්වනු ලබන අවස්ථාවක, (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකිරීමෙන් ඒ තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයන් හෝ සේවකයන් වළක්වාලන ආඥාවක් සහ අවශ්‍ය අවස්ථාවක දී ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ගොඩනගන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙලීමේ බලය ඔහුට දෙන ආඥාවක් ද නිකුත් කිරීම සඳහා, (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශිත ප්‍රදේශය පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(6) මේ පනතේ 20 අ වගන්තියේ විධිවිධාන (5) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) පරීක්ෂණය අවසානයේ දී, (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු නොකිරීමෙහි ලා ප්‍රමාණවත් හේතු, හේතු දක්වන තැනැත්තාට ඇතැයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවන්නේ නම්, මේ වගන්තිය කඩ කරමින් යම් ක්‍රියාවක් කිරීමෙන්, ඒ තැනැත්තා හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් වළක්වාලන ආඥාවක් සහ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ බලය දෙන ආඥාවක් ඔහු විසින් කරනු ලැබිය යුතු ය.”.

4අ සහ 4ආ වගන්ති 4ආ සහ 4ඇ වශයෙන් නැවත අංක කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ සහ 4ආ වගන්ති , පිළිවෙලින් ඒ ප්‍රඥප්තියේ 4ආ සහ 4ඇ වගන්ති වශයෙන් නැවත අංක කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ 4 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 4අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

“ඇල රක්ෂිත ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම.

4අ. (1) ඇල ඉවුරක ඇති යම් ඉඩම් ප්‍රදේශයක් පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක බල ප්‍රදේශය ඇතුළත ද ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව අමාත්‍යවරයා විසින් ඒ ප්‍රදේශය ඇල රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි අතර, ඒ නියමයේ ඒ ප්‍රදේශයේ මායිම් සහ ඉම් සළකුණු දක්වමින් ප්‍රදේශය වෙන්කර දක්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ ලිඛිත අනුමතය නොමැතිව, (1) වන උපවගන්තිය යටතේ ඇල රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත යම් ප්‍රදේශයක තාවකාලික වශයෙන් හෝ වෙනත්

ආකාරයක ගොඩනැගිලි හෝ ව්‍යූහ ඉදි කරනු නොලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ දෙනු ලබන අනුමතයක් පිළිවෙලින් ඉඩම පිහිටි කොට්ඨාසයේ හෝ පළාතේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ හෝ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ නිර්දේශ මත ප්‍රධාන විධායක නිලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන හෝ (2) වන උපවගන්තිය යටතේ අනුමතයක් දෙන ලද්දේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) යම් තැනැත්තකු (2) වන උපවගන්තිය කඩකරමින් ක්‍රියා කරන බව සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා වෙත දන්වනු ලැබූ අවස්ථාවක, (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීමෙන්, ඔහු හෝ ඔහුගේ අනුයෝජිතයන් හෝ සේවකයන් වළක්වන ආඥාවක් සහ ඇල රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත එවැනි යම් ප්‍රදේශයක ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යූහයක් බිඳ හෙළීමට බලය දෙන ආඥාවක් නිකුත් කිරීම සඳහා, ඇල රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශය පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(5) පරීක්ෂණය අවසානයේදී, සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ ලිඛිත අනුමතය නොමැතිව ගොඩනැගිල්ල හෝ ව්‍යූහය ඉදි කර ඇතැයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඒ තැනැත්තා හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් විසින් මේ වගන්තිය කඩ කරමින් යම් ක්‍රියාවක් කිරීම වළක්වන ආඥාවක් කරනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ ගොඩනැගිල්ල හෝ ව්‍යූහය බිඳහෙළීම පිණිස ආඥාවක් වැඩිදුරටත් කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තිය යටතේ අනුමතය දෙන ලදදේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා වෙත අනුමතය දෙනු ලැබුවේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ඊට අනුකූලව කටයුතු කරන ලෙස සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඒ ඇල රක්ෂිත ප්‍රදේශය හෝ එහි යම් කොටසක් පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කර—

(අ) පැනවූ නියම සහ කොන්දේසි කඩ කරමින් ක්‍රියා කිරීමෙන් ඒ තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන් වළක්වන ; සහ

(ආ) පැනවූ නියම සහ කොන්දේසිවලට අනුකූලව ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට හෝ කරගෙන යාමට සැලැස්වීමට සහ ඒ ඉදිකිරීම් කටයුතුවල වියදම ඒ තැනැත්තාගෙන් අයකර ගැනීමට සංස්ථාවට හැකි කරවන,

ආඥාවක් ලබාගත යුතු ය.

(7) (4) වන උපවගන්තිය සහ (6) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් මේ පනතේ 20අ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4ආ වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මගින් නැවත අංක කරන ලද පරිදි වූ 4ආ වගන්තියේ “විකුණනු ලැබිය හැකි ය ” යන වචන වෙනුවට, “ විකිණීම සහ එවැනි යම් ඉඩමක නිවාස සහ ගොඩනැගිලි ඉදි කොට විකිණීම කරනු ලැබිය හැකි ය” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ ඇති "උපදේශක සේවාවන් භාර ගැනීමට." යන වචන වෙනුවට, "උපදේශක සේවාවන් භාර ගැනීමට ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) ඇලවල් පිළිබඳ භාරය, කළමනාකරණය, වැඩි දියුණුව, නඩත්තුව සහ පාලනය තබා ගැනීම සහ ඇලවල් අපවිත්‍ර කිරීම වැළැක්වීම. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ඒ ප්‍රඥප්තියේ 20අ සහ 20ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ සහ 20ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"වළක්වන ආඥාවක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමෙහි ලා කාර්ය පටිපාටිය.

20අ. (1) 2අ වගන්තියේ (5) වන උපවගන්තිය, 2ආ වගන්තියේ (5) වන උපවගන්තිය, 4අ වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 20ඇ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් ලබාගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ඉල්ලීමෙන් ඉදිරිපත් කරනු ලබන කාරණා සත්‍යායනය කෙරෙන දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලීම ලැබුණු විට, ඉල්ලීමෙන් අයැද ඇති පරිදි ඉල්ලීමෙහි නම් කර ඇති තැනැත්තා හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් වළක්වනු නොලැබිය යුතු වන්නේ මක්නිසාදැයි සිතාසියෙහි සඳහන් දින (ඒ දිනය සිතාසිය නිකුත් කරන ලද දිනයේ සිට සති දෙකක් පසු නොවී එළඹෙන දිනයක් විය යුතු ය.) ඉදිරිපත් වී හේතු දක්වන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ඉල්ලීමේ නම් කර ඇති තැනැත්තා වෙත වහාම සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) සිතාසියේ සඳහන් දින, ඒ සිතාසි නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා අධිකරණයේ පෙනී සිටීම පැහැර හැරියහොත් හෝ ඒ ආඥාව නිකුත් කිරීමට එරෙහිව දැක්වීමට කිසිම හේතුවක් තමාට නොමැති බව අධිකරණය වෙත දන්වනු ලැබුවහොත්, අධිකරණය විසින් ඉල්ලීමෙහි අයැ ද ඇති පරිදි, වහාම ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) සිතාසි නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා යථා පරිදි අධිකරණයේ පෙනී සිට ඒ ආඥාව නිකුත් කිරීමට එරෙහිව තමාට හේතු දැක්වීමට ඇතැයි ප්‍රකාශ කරන්නේ නම් අධිකරණය විසින් වහාම නඩුව විභාග කිරීම හෝ යම් පසු දිනයක විභාග කිරීම සඳහා නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) ඉල්ලීම සනාථ කිරීම සඳහා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ සාක්ෂි කිසිවක් කැඳවීමට අධිකරණයට නිසි බලය තිබිය යුතු ය.

(6) පරීක්ෂණය අවසානයේ දී, අධිකරණය විසින්, අවස්ථාවෝචිත පරිදි, 2අ වගන්තියේ හෝ 2ආ වගන්තියේ හෝ 4අ වගන්තියේ හෝ 20ඇ වගන්තියේ සඳහන් පරිදි ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, ඉල්ලීම නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ සහතිකය එහි ඇතුළත් කරුණු පිළිබඳ මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු බව.

20ආ. මේ පනත යටතේ පවරන ලද යම් නඩු කටයුත්තක දී යම් ඉඩමක් —

(අ) 2 වන වගන්තිය යටතේ නියමය මගින් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත ප්‍රදේශයක් තුළ ; හෝ

(ආ) 2ආ වගන්තිය යටතේ නියමයක් මගින් පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ප්‍රදේශයක් ලෙස නිශ්චිත ප්‍රදේශයක් තුළ; හෝ

(ඇ) 4අ වගන්තිය යටතේ නියමය මගින් ඇළ රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත ප්‍රදේශයක් තුළ ; හෝ

පිහිටා ඇත්තේ ද යන බවට ප්‍රශ්නයක් පැන නැගෙන අවස්ථාවක, සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ අත්සන යටතේ වූ සහතිකයක සඳහන් ඉඩම, අවස්ථාවෝචිත පරිදි ගොඩකිරීමේ ප්‍රදේශයක් තුළ හෝ පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ප්‍රදේශයක් තුළ හෝ ඇළ රක්ෂිත ප්‍රදේශයක් තුළ හෝ පිහිටා ඇති බවට වූ ඒ සහතිකය සාක්ෂ්‍යයේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එය එහි ප්‍රකාශිත කරුණු පිළිබඳ මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු ය.

ඇලවල් දූෂණය වරදක් බව.

20ඇ. (1) 4අ වගන්තිය යටතේ නියමයක් මගින් ඇල රක්ෂිතයක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති යම් ඇලකට යම් දූෂණකාරකයක් දැමීමෙන් හෝ බැහැර කිරීමෙන් එම ඇල දූෂණය කරන හෝ දූෂණය කිරීමට සලස්වන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක්ලක්ෂයකට නොඅඩු සහ රුපියල් පන්ලක්ෂයකට නොවැඩි දඩයකට සහ වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද දිගටම සිදු කරනු ලැබීමේ දී වරද සිදුකරනු ලබන එක් එක් දිනකට රුපියල් එක් දහස බැගින් වූ දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(2) එම දූෂණය —

(අ) එසේ වරදකරු කරනු ලැබීමට පසුව, බාධාවකින් තොරව දින දාහතරකට වැඩි කාලයක් දිගටම සිදුවන අවස්ථාවක ; හෝ

(ආ) මගින් එම ඇලේ ජලය නිදහසේ ගලායාම පවත්වාගෙන යාමට හෝ එම ජලයේ ආරක්ෂාවට හෝ එම ජලයේ පිරිසිදුභාවයට බරපතල තර්ජනයක් සිදු වන අවස්ථාවක,

සංස්ථාව විසින් ඉල්ලීමක් කරනු ලැබීමේ දී මහෙස්ත්‍රාත්වරයා විසින් වහාම ආඥාවක් කරමින් අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය විය හැකි පරිදි පිස්කල්වරයාගේ හෝ පොලීසියේ සහාය ඇතිව එම දූෂණය සිදුවීම සඳහා කෙලින්ම හෝ අන්‍යාකාරයකින් වගකිව යුතු යම් ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ කටයුත්තක් වසා දැමීමෙන් එම දූෂණයට හේතු ඉවත් කරන ලෙස එම දූෂණය සිදු කරන තැනැත්තන්ට නියම කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "දූෂණය" සහ "දූෂණකාරකය" යන යෙදුම්වලට 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 22අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"දණ්ඩන කිසිවක් නියම කර නොමැති වරදක් සම්බන්ධයෙන් දණ්ඩනය.

22අ. මේ පනත යටතේ දණ්ඩනයක් නියම කර නොමැති වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම රුපියල් එක්ලක්ෂයකට නොඅඩු සහ රුපියල් පන්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ "මණ්ඩලය" යන යෙදුමේ අර්ථ කථනයෙන් පසුව පහත දැක්වෙන අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "රැඳවුම් ප්‍රදේශය" යන්නෙන්, කිසියම් ප්‍රදේශයක පවත්නා කසළ කානු ක්‍රමයකින් ජලය ගලා බැසීමට සැලැස්විය හැකිවන තුරු, යම් සීමිත කාලපරිච්ඡේදයක් සඳහා වේගයෙන් ගලාබසින හා ගලා යන ජලය එක්රැස් කරගනු පිණිස නියමිත යම් පහත් බිම් ප්‍රදේශයක් අදහස් වේ.'.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.